කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

කාර්ය පත්‍රිකාව

විෂය- සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

**පුද්ගල පරිගණකවල දෘඩාංග පිරිවිතර හඳුනා ගනී.**

ශ්‍රේණිය - 12

පාඩම - 1

නිපුණතාවය 1 - කාලීන ප්‍රතිලාභ නෙලා ගැනීමට පරිගණකය සහ එහි විභවය ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 1.2 - පුද්ගල පරිගණකවල දෘඩාංග පිරිවිතර හඳුනා ගනී.

## දත්ත යනු -

පරිගණකය හෝ මිනිසා හෝ විසින් කිසියම් ක්‍රියාවක් සඳහා යොදා ගනු ලබන ප්‍රමාණයන්,අනුලක්ෂණ හා සලකුණු වැනි මූලික කරුණු ය.පරිගණකය තුළ මෙම දත්ත විද්‍යුත් සංඥා ලෙස සම්ප්‍රේෂණය වන අතර ආචයන මාධ්‍යයන්හි ගබඩා කෙරේ.

## තොරතුරු යනු -

පරිශීලකට කිසියම් අර්ථයක් ලබා දෙන්නා වූ, සංවිධානය වූ නැතහොත් සකස් කරන ලද දත්ත වේ.තොරතුරු මගින් පරිශීලකට කිසියම් දෙයක් පිළිබඳව තීරණ ගැනීමට හැකියාවක් ලබා දේ.

## තොරතුරුවල පැවතිය යුතු ගති ලක්ෂණ -

1.අදාළතාව
2.නිරවද්‍ය බව
3.පරිපූර්ණත්වය
4.කාලීන බව
5.විශ්වසනීයත්වය
6.ප්‍රවේශවීමේ හැකියාව

## පිරිවිතර -

යමෙකුට තමාගේ අවශ්‍යතා සපුරාලන අන්දමේ පරිගණකයක් මිළදී ගැනීමට උපකාරී වීම සඳහා වෙළෙන්දා විසින් සපයනු ලබන,පරිගණකයේ මූලික සංරචකවල ගුණාංග හෝ හැකියා හෝ පිළිබඳ ලැයිස්තුවකි.

## ඇගයීම

1.පරිගණකයක පිරිවිතර සලකා බැලීමේදී වැදගත් වන සංරචක 5ක් ලියන්න.
2.පරිගණකයක් මිළදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.